## අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

## සිසුන් සහ දෙමාපියන් වෙත නිකුත් කරන වැදගත් නිවේදනයයි - අතිවිශිෂ්ට දක්ෂතා දැක්වූ අ.පො.ස. (උසස් පෙළ) සිසුන් සඳහා වන රජයේ ශිෂ්‍යත්ව වැඩසටහන

"පොහොසත් රටක් – ලස්සන ජීවිතයක්" රජයේ ප්‍රතිපත්ති රාමුව සහ 2025 අයවැය යෝජනාවලට අනුකූලව, අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් ඉහළතම දක්ෂතා දැක්වූ සිසුන් 200දෙනෙකුට ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම්වල ඉහළම ස්ථාන හිමි විදේශීය විශ්වවිද්‍යාලවල ප්‍රථම උපාධි පාඨමාලා හැදෑරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ශිෂ්‍යත්ව වැඩසටහනක් හඳුන්වා දී ඇත.

මෙම වැඩසටහන **ක්‍රියාත්මක කර පරිපාලනය කරනු ලබන්නේ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පමණි. 2025 අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන්** අතිවිශිෂ්ට ප්‍රතිඵල ලබාගත් සිසුන්ගෙන් මෙහි දෙවන අදියර සඳහා දැනට අයදුම්පත් කැඳවා ඇත.

මෙම රජයේ ශිෂ්‍යත්ව වැඩසටහනට තමන් සම්බන්ධ බව පවසමින් විවිධ **අනවසර පෞද්ගලික නියෝජිතයන් සහ ආයතන**, සිසුන් සහ දෙමාපියන් නොමඟ යවන බව අමාත්‍යාංශය විසින් නිරීක්ෂණය කර ඇත.
**ඒ අනුව, පහත කරුණු පිළිබඳව මහජනතාව වෙත දැනුම් දෙනු ලැබේ:**

- කිසිදු පෞද්ගලික ආයතනයක්, උපදේශන සේවාවක් හෝ නියෝජිතයෙකු සමඟ අමාත්‍යාංශයට කිසිදු **හවුල්කාරිත්වයක්, ගිවිසුමක් හෝ සම්බන්ධතාවයක් නොමැත.**
- අමාත්‍යාංශය නියෝජනය කිරීමට, අයදුම්පත් සැකසීමට, අපේක්ෂකයින් නිර්දේශ කිරීමට හෝ තේරීම් කටයුතුවලට බලපෑම් කිරීමට **කිසිදු පෞද්ගලික පාර්ශවයකට අවසර ලබා දී නැත.**
- අයදුම්පත් භාර ගැනීම සහ ඇගයීම **විනිවිදභාවයකින් යුත්, තරඟකාරී සහ කුසලතා මත පදනම් වූ ක්‍රියාවලියක්** හරහා **සෘජුවම අමාත්‍යාංශය** විසින් සිදු කරනු ලබයි.
- අයදුම්කරුවන් අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා කිසිදු නියෝජිතයෙකුගේ හෝ අතරමැදියෙකුගේ සහය ලබා ගැනීම **අවශ්‍ය නොවේ.**
- අනවසර තෙවන පාර්ශ්වයන් සමඟ ගනුදෙනු කිරීමෙන් පැන නගින කිසිදු ප්‍රතිඵලයක් සඳහා වූ වගකීම අමාත්‍යාංශය විසින් **භාර නොගනු ඇත.**

**අමාත්‍යාංශ නිල නිවේදන පිළිබඳව පමණක් විශ්වාසය තබන ලෙස සිසුන්ට සහ දෙමාපියන්ට තරයේ උපදෙස් දෙනු ලැබේ.**
මෙම රජයේ ශිෂ්‍යත්ව වැඩසටහන පිළිබඳව වැරදි තොරතුරු පතුරුවන හෝ මහජනතාව නොමඟ යවන ඕනෑම පුද්ගලයෙකුට හෝ ආයතනයකට එරෙහිව ශ්‍රී ලංකාවේ නීතිය යටතේ දැඩි නීතිමය පියවර ගනු ලැබේ.

**ලේකම්**
**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**
**2026 මැයි 06**